# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 36 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ඔක්තෝබර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිළ: ශත 35 යි

තැපැල් ගාස්තුව: ශත 35 යි

# 1980 අංක 36 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 සැප්තැම්බර් මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 50/80

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1980 අංක 36 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පනතෙහි 12අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 12අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"ඇතැම් අවස්ථාවල දී පත් කිරීමේ බලතල පැවරීම හා ක්‍රියාත්මක කිරීම ආදිය.

12අ. (1) මේ පනතේ 6 සිට 12 තෙක් වූ වගන්තිවල (ඒ වගන්ති දෙකම ඇතුළුව) කුමක් සඳහන් වුව ද, අවස්ථාවෝචිත පරිදි, උපදේශක මණ්ඩලයෙන් හෝ විනය මණ්ඩලයෙන් නැතහොත් උපදේශක මණ්ඩලය වෙත හෝ විනය මණ්ඩලය වෙත කරනු ලබන යොමු කිරීමකින්, පළාත් පාලන කටයුතු පරිපාලනය කිරීම කවර හෝ ආකාරයකින් ප්‍රමාද වීමට හෝ සීමාවීමට ඉඩ ඇතැයි අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතයට යටත්ව—

(අ) අවස්ථාවෝචිත පරිදි, උපදේශක මණ්ඩලයෙන් හෝ විනය මණ්ඩලයෙන් නැතහොත් උපදේශක මණ්ඩලය වෙත හෝ විනය මණ්ඩලය වෙත යොමු නොකොට සේවාවේ සාමාජිකයන් පත් කිරීමේ, මාරු කිරීමේ, මුදාහැරීමේ, විශ්‍රාම ගැන්වීමේ, ඔවුන්ගේ ධුර අහෝසි කිරීමේ, ඔවුන් සේවයෙන් පහ කිරීමේ සහ ඔවුන්ගේ විනය පාලනය කිරීමේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය; නැතහොත්

2— ඒ 50729—10,025 (80/07)

(ආ) සේවාවේ සාමාජිකයන්ගේ සියලු ශ්‍රේණි හෝ ඉන් කවර හෝ ශ්‍රේණියක් සම්බන්ධයෙන් ඒ සියලු බලතල හෝ ඒ බලතල අතුරින් යම් බලයක් හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, පදවි නාමයෙන්, යම් රජයේ නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි අතර, ඒ සෑම අවස්ථාවක දී ම ඒ රජයේ නිලධරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, උපදේශක මණ්ඩලයෙන් හෝ විනය මණ්ඩලයෙන් නැතහොත් උපදේශක මණ්ඩලය වෙත හෝ විනය මණ්ඩලය වෙත යොමු නොකොට එවැනි යම් බලයක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එසේ පවරනු ලැබූ එවැනි යම් බලයක්, ඒ රජයේ නිලධරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතයට යටත්ව, ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ යම් නියමයක් අමාත්‍යවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් බලාත්මකව පැවතිය යුතු ය.".

අතීතයට බලපෑම.

3. මේ පනත මගින් ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතට කරන ලද සංශෝධනය 1980 ජූලි මස 17 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.